පහත සඳහන් මව්බිම ලිපිය තුළ, එක් රෝගියෙකු පිළිබඳව සඳහන් කිරීමේදී 'ශ්‍රී ලාංකික' ලෙසින් යොදාගන්නේත්, තවත් රෝගියෙකු පිළිබඳව සඳහන් කිරීමේදී 'දෙමළ ජාතිකයෙකු' ලෙසින් යොදාගන්නේත් මන්ද යන්න පැනයකි. මෙහිදී සිහිපත් කළ යුත්තේ, පුවතට සෘජුවම අදාළ නොවන අවස්ථාවකදී යම් අයෙකුගේ වාර්ගිකත්වය සඳහන් නොකිරීම ආචාර ධාර්මික ජනමාධ්‍ය භාවිතාව බවයි.

එලෙසින්ම මේ වනවිට කොවිඩ්-19 සම්බන්ධයෙන් සමාජයේ ඇති බිය සහ සැකය සමගින්, කොවිඩ්-19 රෝගීන්ව කොන් කිරීමකට ලක්වන අයුරුද දක්නට ලැබේ. එම පසුබිමේදී 'ආසාදිතයා හෙළිවන විටම පැටිකිරියත් එළියට' වැනි උප සිරස්තල ලිපියකට යොදාගැනෙන්නේ ආසාදිතයින්ගේ "පැටිකිරිය" කුමක්ද කියා බැලීමට යොමුවන පාඨකයින් ලිපියට ආකර්ෂණය කර ගැනීමේ උත්සාහයක් ලෙසද? මෙය පාඨකයා නොමග යවනා උත්සාහයක් නොවේද?

කොවිඩ්-19 වැළඳීම කිසිවෙකුගේ වරදක් නොවන බව අපි නැවත නැවතත් සිහිපත් කරමු. එසේම කොවිඩ්-19 වසංගතය ලෝක ව්‍යාප්තව පැතිර යන මේ මොහොතේදී, ජනමාධ්‍යවේදීන් ආචාර ධාර්මික වූත්, වෘත්තිමය වූත් ජනමාධ්‍ය භාවිතාවක් අනුගමනය කිරීම අත්‍යාවශ්‍ය බවද සිහිපත් කරමු.
#MediaEthicsSL #SinhalaPress #lka #Mawbima